# සිංහල



## 2 ශ්‍රේණිය

e තක්සලාව
The National e-learning Portal for The General Education
Start Your Learning Journey with e-thaksalawa

# 9. ගැහැනු , පිරිමි හඟවන පද

## ක්‍රියාකාරකම 1

### පියවර 1

- පළමු වන ශ්‍රේණියේ දී ඉගෙනගත් ගැහැනු පිරිමි හඟවන ලද පද දරුවා ලවා කියවන්න.

| | | |
|---|---|---|
| අම්මා | - | තාත්තා |
| නංගී | - | මල්ලී |
| ගිරවා | - | ගිරවිය |
| පූසා | - | පූසි |
| කුරුල්ලා | - | කිරිල්ලිය |

### පියවර 2

- පාට දෙකකින් පහත වචන කාඩ්පත්වල ලියාගන්න.

| | |
|---|---|
| කුකුළා | කිකිළි |
| පුතා | දුව |
| ගුරුතුමා | ගුරුතුමිය |
| රජු | රැජින |
| වෛද්‍යවරයා | වෛද්‍යවරිය |

පිරිමි පදය කියූ විට ඊට අදාළ ගැහැනු පදය සහිත කාඩ්පත පෙවීමට දරුවා යොමු කරන්න.

### පියවර 3

- එක් පාටක කාඩ්පත් එක පැත්තක ඇලවීමට උපදෙස් දෙන්න. - පිරිමි පද
- ඊට ගැහැනු පද සොයා ඉදිරියෙන් ඇලවීමට යොමු කරන්න.
- එම පත්‍රිකාව දරුවා ලවා කියවන්න.